# 1 – අතීතයෙන් කතාවක් අර්ථාවබෝධය හා රසවින්දනය



"ඒ මිහිපල් තෙමේ සතියක් පුරා නා නා පූජා සත්කාර කරවා තෙරුන්ගේ බද්ධමාලක නම් තැන සුවඳ දර සෑයක් කරවා මනරම් කුළු එහි පමුණුවා............... දර සෑයෙහි තබ්බවා අවසන් ගරු බුහුමන් කළේය." (මහාවංසය - XX, 29-44)




<u>මිහිඳු හිමි වැඩි ගමන් මග</u>

අන්තර්ගතය : ස්වර්ණා වීරසිංහ - ගුරු උපදේශක, සිංහල (කැලණිය කලාප අධ්‍යාපන කාර්යාලය )
සැකසුම : W.G.P.සංජය අමරතුංග - රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය

<u>මගධ රාජ්‍යය</u>

චන්ද්‍ර ගුප්ත රජු

↓

ධර්මාශෝක රජු

| | |
|---|---|
| මිහිඳු හිමි | සංඝමිත්තා තෙරණිය |
| බුදුදහම රැගෙන ඒම. | ශ්‍රී මහා බෝධිය වැඩම කිරීම. |
| (අනුබුදු) | |

## <u>අතීතයෙන් කතාවක් පාඩම උපුටා ගැනීම</u>

Voices from Ancient Sri Lanka

කතෘ - ආචාර්ය ආනන්ද ගුරුගේ මහතා.

සිංහල පරිවර්තනය - හෙළදිව අතීත ප්‍රතිරාව.

- ආභය හේවාවසම් මහතා.

The National e-learning Portal for The General Education

## මහින්දාගමනයෙන් ලක්දිව ඇති වූ ප්‍රබෝධය

- පිළිගත් ආගමක් ලැබීම. (බුද්ධ ධර්මය)



- අවිහිංසාවාදයට ගරුකරන සමාජයක් බිහි වීම.



- තිසරණ ගිය උපාසක පිරිසක් බිහි වීම.



- මහින්දාගමනය හා දුමින්දාගමනයෙන් විධිමත් වූ ගෘහ නිර්මාණ ශිල්ප කලාවක් බිහි වීම.

උදා :-



මහා විහාරය



රුවන්වැලිසෑය



ථූපාරාමය



සංඝාවාස



සඳකඩපහන



රජ වාසල ඉදිකිරීම්

- උද්‍යාන ඇති කිරීම.
  උදා :- මහමෙව්නා උයන

- ප්‍රතිමා නිර්මාණය
  උදා :-



සමාධි පිළිමය



අවුකන පිළිමය

- වාරි තාක්ෂණයේ දියුණුව



කලා වැව

- උගතුන්, පරිපාලකයන්, ව්‍යාපාරිකයන්, කලාකාරුවන්, තාක්ෂණවේදීන් ලක්දිවට හිමි වීම.
- "ලක්දිව" නාමය ලොව පතළ වීම.

## මිහිඳු හිමියන්ගෙන් ගත හැකි ජීවිතාදර්ශ.

- ශාන්ත බව. ("ශාන්ත ඉරියව් මා සිත් ගත් අතර...............")

- කෙනෙකුගේ බුද්ධිය පරීක්ෂා කිරීමේ හැකියාව.
  (දෙවන පැතිස් රජතුමා මුණ ගැසුණු මොහොතේ ඇති වූ සංවාදය)

  මිහිඳු හිමි - "මේ ගස කුමක් ද?"
  රජු - "අඹ ගසකි ස්වාමිනි."
  මිහිඳු හිමි - "මේ අඹ ගස හැර තවත් අඹ ගස් තිබේ ද?"
  රජු - "වෙනත් අඹ ගස් තිබේ."
  මිහිඳු හිමි - "ඒ අඹ ගසුත් මේ අඹ ගසත් හැර තවත් ගස් තිබේද?"
  රජු - "අඹ නොවන වෙනත් ගස් තිබේ."
  මිහිඳු හිමි - "ඒ ගසුත් වෙනත් අඹ ගසුත් හැර තවත් ගස් තිබේද?"
  රජු - "ඇයි මේ අඹ ගස.

- දේශනා පැවැත්වීමේ හැකියාව.
  උදා : " තමන් දෙසූ දහම එහි සිටියවුනට වැටහිණි ද යන්න පිළිබඳ ව උන් වහන්සේ නිරන්තරයෙන් සැලකිලිමත් වූහ."

- නිර්මාණශිලීත්වය හා සූක්ෂ්ම සැලසුම් ක්‍රම පිළිබඳ දැනුම.
  උදා : " උන් වහන්සේගේ නිර්මාණශිලීත්වය හා සූක්ෂ්ම සැලසුම් ක්‍රම සඳහා දෙස් දෙමින් ඒ විශාල භූමි භාගය වසා පැතිරී ඇත්තේ මහා විහාරය යි."
  " බෝධීන් වහන්සේ සඳහා ද මහා ස්තූපය සඳහා ද මෙහෙණියන්ගේ ආශ්‍රම සඳහා ද දාන ශාලා සඳහා ද උන් වහන්සේගේ සැලසුමේ ඉඩකඩ වෙන් වී තිබිණි. "

- අල්පේච්ඡ ජීවිතයක වටිනාකම පෙන්වීම.

  උදා : " උන් වහන්සේ නැවත කුඩා ගල් ගුහා කීපයක් තිබෙන මිස්සක පව්ව බලා වැඩම කළ සේක"

- ධර්මානුකූල චින්තනය මගින් යහපත් සමාජයක් බිහිකළ හැකි බව.

උදා : “ යහපත් දෑ කිරීමෙන් යහපත් ප්‍රතිඵල ලැබීමත් අයහපත් දෑ කිරීමෙන් අයහපත් ප්‍රතිඵල ලැබීමත් අරමුණු කර ගනිමින් උන් වහන්සේ දහම් දෙසූහ. ”

- රට වෙනුවෙන් කැපවීම.

උදා : “ මෙසේ මිහිඳු හිමියන්ගේ දීර්ඝකාලීන කැපවීමේ ප්‍රතිඵලයක් වශයෙන් අප රටට සිදු වූ යහපත විශිෂ්ට සම්පතකැයි විවාදයෙන් තොර ව පිළිගත යුතු ය. ”

The National e-learning Portal for The General Education

අන්තර්ගතය : ස්වර්ණා වීරසිංහ - ගුරු උපදේශක, සිංහල (කැලණිය කලාප අධ්‍යාපන කාර්යාලය )
සැකසුම : W.G.P.සංජය අමරතුංග - රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය